5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟා කර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම	5.a කාන්තාවන්ත ආර්ථික අයිතිවාසිකම් ලබාදීම සඳහාවූ සංශෝධන සිදු කිරීමට කටයුතු කිරීම සහ දේශීය නීති වලට අනුව ඉඩම් සහ වෙනත් ආකාර වල දේපල මූල්‍ය සේවාවන්, උරුමයන් සහ ස්වාභාවික සම්පත්වල හිමිකාරිත්වය	5.a.1 හිමිකම් මාදිලිය අනුව (a) ස්ත්‍රී පුරුෂ භාවය අනුව කෘෂිකාර්මික ඉඩම් සම්බන්ධයෙන් හිමිකමක් නැතහොත් සුරක්ෂිත අයිතියක් සහිත සමස්ථ කෘෂිකාර්මික		√	

	ලබාගැනීම සහ පාලනය සිදු කිරීම සඳහා අවස්ථාව ලබාදීමට කටයුතු කිරීම	ජනගහනයේ ප්‍රමාණය (b) කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ හිමිකරුවන් සහ අයිතිවාසිකම් දරන්නන් අතර කාන්තාවන්ගේ පංගුව			

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අභියෝග

- වර්ෂය පුරා පැවති අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් ගංවතුර තත්වයන් නිසා ඉදිකිරීම් සඳහා කටයුතු ප්‍රමාදතාවයන් සිදු වීම
- කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය නවීන යන්ත්‍ර හා උපකරණ ආනයනය කිරීමේදී පනවන ඉහළ බදු සීමාවන් හේතුකොටගෙන ආනයන සීමා වීම හා ඒ සඳහා දැරීමට සිදුවන අධික පිරිවැය.
- දෙපාර්තමේන්තු පාලනය යටතේ පවතින සුළු වාරි මාර්ග 40000ක් පමණ නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉංජිනේරු වරුන් හා තාක්ෂණික නිලධාරීන් නොමැති වීම හා සුළුවාරි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති විධිමත්ව අධීක්ෂණය කිරීමට නොහැකි වීම.
- කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වරුන් සඳහා ප්‍රමාණවත් තාක්ෂණික දැනුමක් නොමැතිවීම.
- ඉලක්කගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මුහුණපාන ප්‍රාග්ධන හිඟකම.

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(හිඟය)
ජ්‍යෙෂ්ඨ	130	79	51
තෘතියික	647	440	207
ද්විතියික	17415	10889	6526
ප්‍රාථමික	1572	1390	182

6.2. දෙපාර්තමේන්තුවට අනුමත කාර්ය මණ්ඩලය 19764 වන අතර 2025.12.31 දිනට පුරප්පාඩු 6966ක් පවතී. රාජ්‍ය සේවයට බඳවාගැනීම් සමාලෝචනය කිරීමත් සමඟ ඉදිරි කාලවකවානුව තුළ නව බඳවා ගැනීම් සිදු කරන තෙක්, පවත්නා කාර්ය මණ්ඩලය තුළින් උපරිම කාර්ය සාධනයක් ලබා ගැනීමට හා දෙපාර්තමේන්තුවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා පුරප්පාඩු පවතින තනතුරුවල වැඩබැලීමේ පදනමින් අවශ්‍ය අවස්ථාවලදී දැනට සිටින නිලධාරීන් යොදාගනු ලබයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

දේශීය විදේශීය පුහුණු ඇතුළු වෙනත් වැඩසටහන් - කාල සීමාව **2025.01.01** සිට **2025.12.31** දක්වා							
අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	සම්මත ආයෝජනය (Rs'*000*)		වැඩසටහනේ ස්වභාවය දේශීය/විදේශීය	නිමැවුම ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	Masters/ Degree courses/ Other courses (For Staff officers)	11	2024.01.01-2024.12.31	827,500.00	-	දේශීය	
02	නවක ප්‍රාථමික මට්ටමේ සේවකයින් සඳහා වන පුහුණුව				-	දේශීය	
03	කොළඹ/කළුතර/ගම්පහ	66	2024.03.06	59,380.00	-	දේශීය	
04	කුරුණෑගල/කෑගල්ල/පුත්තලම/ අනුරාධපුර	57	2024.03.26	107,975.00	-	දේශීය	
05	ගාල්ල/මාතර/හම්බන්තොට	75	2024.03.28	134,140.00	-	දේශීය	
06	මොණරාගල/අම්පාර	56	2024.04.20	53,940.00	-	දේශීය	
07	නුවරඑළිය	50	2024.05.18	94,400.00	-	දේශීය	
08	මහනුවර	26	2024.06.15	82,240.04	-	දේශීය	
09	රත්නපුර	37	2024.05.11	32,560.00	-	දේශීය	
10	බදුල්ල	17	2024.06.29	105,651.00	-	දේශීය	
11	මාතලේ	41	2024.04.27	56,175.00	-	දේශීය	
12	පොතුහැර	21	2024.10.30	50,160.00	-	දේශීය	
13	භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම පිළිබඳ පුහුණු වැඩසටහන -	32	2024.08.1/2/3	236,419.00	-	දේශීය	

	ඇඹිලිපිටිය නායකත්ව සං.ජාතික මධ්‍යස්ථානය						
14	විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා පැමිණිලි මෙහෙය වීමේ නිලධාරීන් පුහුණු කිරීමේ පුහුණුව	32	2024.08.30/31	192,231.00	-	දේශීය	
15	Procument & Contract Administration -ජල.කළ. අංශය	73	2024.12.13	438,000.00	-	දේශීය	
16	රත්නපුර ගො.සං.දි.කාර්යාලීය නිලධාරීන් සහ ගො.සං.ප්‍රා.නි.සඳහා ආකල්ප සංවර්ධනය හා නායකත්ව සංවර්ධනය	87	2024.12.21	216,905.00	-	දේශීය	
17	රත්නපුර දිස්.කාර්යාලය - ගො.සං.දි.කාර්යාලය - පිඹුරුපත් අධ්‍යනය පිළිබඳ පුහුණුව	32	2024.12.24	40,150.00	-	දේශීය	
18	2011 අංක 46 දරණ ගො.සං.(සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගො.සං.පනත පිළිබඳ පුහුණුව	52	2024.12.12/13	158,720.00	-	දේශීය	
9	අභ්‍යන්තර විගණන නිලධාරීන් සඳහා වන පුහුණුව -අභ්‍යන්තර විගණන අංශය	39	2024.12.02-09	502,125.00	-	දේශීය	
20	කාර්යාල ක්‍රම,වැටුප් පරිවර්ථන ලිපිගොනුකරණය පුහුණුව - ආයතන අංශය	30	2024.12.20/24	22,730.00	-	දේශීය	
21	මූලික විමර්ශන පැවැත්වීම පිළිබඳ පුහුණුව -විනය අංශය	40	2024.12.23/24	202,428.00	-	දේශීය	
22	මු.රෙ.104 පරීක්ෂණ	54	2024.03.22	86,987.50	-	දේශීය	
23	අනවසර කටයුතු සම්බන්ධයෙන් නීති පුහුණු වැඩසටහන -ගම්පහ	90	2024.12.18	51,920.00	-	දේශීය	
24	ගොවිජන සමාලෝචන මණ්ඩලයේ සාමාජිකයින් සහ ගොවිජන විනිශ්චය සහා විනිසුරුවරුන්	52	2024.12/17/18/19	387,365.00	-	දේශීය	
25	කාර්ය මණ්ඩලය සඳහා නීති පුහුණුව -මුලතිවු දිස්ත්‍රික්කය			211,250.00	-	දේශීය	
		1070		**4,351,351.54**			

පුහුණු වැඩසටහන් මඟින් අප දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම,කුසලතා,ආකල්ප වර්ධනය කිරීමට ,සේවක ඵලදායිතාවය හා කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට,දැනුම යාවත්කාලීන කර ගැනීමට හා බෙදාගැනීමට, රැකියා තෘප්තිමත්භාවය වර්ධනය කර ගැනීමට ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එම නිසා අප දෙපාර්තමේන්තුවේ ඉලක්ක හා අරමුණු ලඟා කර ගැනීමට පුහුණු වැඩසටහන් පැවැත්වීම ඉතාමත් වැදගත් වේ.

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-	-	-
1.6	වෙනත්	-	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	එක් එක් අංශ විසින් විමධ්‍යගත ලෙස ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන යනු ලබයි.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	-	-	-
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,	අනුකූල නොවේ		

	සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම			
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1 – 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන වාර්තාවලට පිළිතුරු ලබා ගැනීම දිස්ත්‍රික්කය භාරව කටයුතු කරන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් මඟින් සිදු කරන අතර, නි/සහකාර කොමසාරිස්වරුන් වෙත යොමු කරන අභ්‍යන්තර විගණන වාර්තාව ගොවිජන සංවර්ධන නිලධාරීන් වෙත යොමු කර පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කිරීම් කර, පිළිතුරු ලබා දීම සිදුකරයි. එසේ පිළිතුරු ලබාදීමේ දී මාසයකට අධික කාලයක් ගතවන බව දන්වා සිටිමි.	අභ්‍යන්තර විගණන වාර්තා සඳහා පිළිතුරු ලබා ගැනීමට අදාලව දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් දැනුවත් කිරීම නියෝජ්‍ය/සහනාර කොමසාරිස්වරුන්ගේ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී හා දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී සිදු කරනු ලැබේ.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ	අනුකූල වේ	-	-

	කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම			
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අංශ කිහිපයකට අදාලව භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට ලබා දී නොමැත	සියලු නිලධාරීන් නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලබාදිය යුතු බවට දැනුවත් කර ඇත.
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ	යම් ප්‍රමාදයක් සිදුවූවත් නියමිත පරිදි අතිරික්ත හා ඌනතා සම්බන්ධ කටයුතු කර ඇත.	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.	අනුකූල වේ	-	-

	103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම			
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		මු.රෙ. 396 ප්‍රකාරව ශේෂ නිරවුල් කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාල දැනුවත් කර ඇත.
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල නොවේ		2025 වර්ෂයේ සීමාව ඉක්මවා ඇති බැවින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		තොරතුරු සොයාගත නොහැකි ණය ශේෂ හා පැහැර හරින ණය ශේෂ පිළිබඳ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේශණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ	-	-
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ	-	-
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාළ නොවේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**	අනුකූල වේ	-	-

16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්යය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**	අනුකූල වේ	-	-
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කර තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රසංශා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ	දෙපාර්තමේන්තුවට අදාල පුරවැසි ප්‍රඥප්තිය සකස් කර ප්‍රදර්ශනය කර ඇත.	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින්	අනුකූල වේ	-	-

	ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**	අනුකූල වේ	-	-
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 13කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	2023.11.30 දිනැති රා.ප.ව.02/2018(I) අනුව කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවන බව දන්වා ඇත.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ	-	-
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ	නිරීක්ෂණ හා නිර්දේශ සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත	

B.H.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	ARI/B/ADD/FA/02/25/50/24	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2026 මැයි 29 දින

2026 JUN 02

ගණන්දීමේ නිලධාරී
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

CA

ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

CG/ 2026 JUN 23

යථෝක්ත වාර්තාව හා සහතික කළ මූල්‍ය ප්‍රකාශනයේ දෙවන පිටපත (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) මේ සමඟ එවා ඇත.

පී.කේ.එම්.පී.නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පී.කේ.එම්.පී. නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

03 JUN 2026
පිළිගත් දිනය

පිටපත් : 1. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - සම්පිණ්ඩන වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනවල මුල් පිටපත මේ සමඟ ඉදිරිපත් කරමි.

2. ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ARI/B/ADD/FA/02/25/50/24 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2026 මැයි 29 දින

ගණන්දීමේ නිලධාරී

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධන) පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පසුව නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මුල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මුල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් නොවන ලැබීම්

මාතලේ ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ පිහිටි ආපන ශාලාව 2018 වර්ෂයේ සිට තුන්වන පාර්ශවයක් වෙත බදු දී ඇති අතර 2025 දෙසැම්බර් දක්වා ලද රු.1,343,982 ක කුලී ආදායම රජයේ ආදායම් ලෙස හඳුනා නොගෙන ගොවිජන සේවා දිස්ත්‍රික් කාර්යාලයේ සුභ සාධක සංගමය වෙත බැර කර තිබීම හේතුවෙන් වෙනත් ලැබීම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) 2024 වර්ෂයේ විසර්ජන ගිණුමේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වර්ෂ අවසාන ශේෂය 2025 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ඒමේ දී රු.36,319,072ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතුව පිරිවැය රු.969,390,652ක වාහන පවතින බව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කර තිබුණ ද, සිගාස් පරිගණක පද්ධතියේ එක් එක් වාහනය පිළිබඳව විස්තරාත්මක තොරතුරු සඳහන් කර නොතිබුණු බැවින් දෙපාර්තමේන්තුව සතු සියලු වාහන වල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය වන බවට තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) ගොවිජන සේවා මධ්‍යස්ථාන 566ට අදාළව ගොවිජන සේවා මධ්‍යස්ථාන 515කට අයත් ඉඩම් වටිනාකම හා ගොවිජන සේවා මධ්‍යස්ථාන 71කට අයත් ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.3. මූල්‍ය වත්කම්

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය රු.559,861,595 ක් වුවද කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂය රු.556,198,917 ක් වූයෙන් රු.3,662,678 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ගොවි බැංකු නියමු ව්‍යාපෘතිය නමින් ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ 2025 වර්ෂයේ දී රු.28,695,312 ක බැංකු ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණු අතර මේ හරහා සිදු වන ගණුදෙණු සම්බන්ධයෙන් ගිණුම් තැබීමක් හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් ද සිදු කර නොතිබුණි.

1.6.4. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි 891 (i) ප්‍රකාරව, ඇප තැන්පතු ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.2	මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වර්ෂ අවසාන ශේෂය වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ගිණුම්ගත කළ යුතු ය.	1.6.2 (අ)
1.6.3	දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂයේ වෙනස නිවැරදි කළ යුතු ය.	1.6.3 (අ)

3. මූල්‍ය සමාලෝචනය

3.1. අවධිමත් ගනුදෙනු

(අ) ගොවි බැංකු නියමු ව්‍යාපෘතිය

(i) දෙපාර්තමේන්තුව ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ගෙන යාම සඳහා ගොවි හාර අරමුදලෙන් ලැබෙන මුදල් තැන්පත් කරමින් ලංකා බැංකුවේ ටොරින්ටන් චතුරස්‍ර

ශාඛාවේ 2323343 දරන ගිණුම් අංකය යටතේ ජංගම ගිණුමක් පවත්වාගෙන යනු ලබන අතර එම ගිණුම හරහා ගොවිජන සේවා කාරක සභා/ ගොවිජන සංවර්ධන සභාවල පිහිටුවා ඇති ගොවි බැංකු වෙත මූල්‍ය ආධාර ලබා දීම සිදු කර තිබුණු අතර ගොවීන්ගෙන් අය කරනු ලබන ණය වාරික වල පොලී මුදලින් කොටසක් මෙම ගිණුමට බැර කරනු ලබයි. මෙම අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කිරීමට කටයුතු කර නොතිබුණි. පාර්ලිමේන්තුවේ සම්මත කෙරෙන පනතකින් හැර වෙනත් කිසිදු ආකාරයකින් නව අරමුදල් ඇති කිරීම සපුරා තහනම් වන අතර මු.රෙ. 876 (3) ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත් විගණිත දින වන 2026 මාර්තු 26 දක්වා එසේ කර නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය මඟින් 2025 දෙසැම්බර් 31 දිනට ගොවීන් 24,635ක් වෙත ප්‍රදානය කරන ලද ණය මුදලින් රු.555,123,717ක මුදලක් හිඟ ණය ලෙස දීර්ඝ කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉන් සියයට 54 ක මුදලක් වසර 03 කට වැඩි කාලයක සිට අයවීමට ඇති බව නිරීක්ෂණය විය.

(iii) ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය ගොවීන්ගේ සුභසාධනය හා ඔවුන්ගේ ගොවි කටයුතු පවත්වාගෙන යාමට අරමුණු කරගත් ව්‍යාපෘතියක් ලෙස සලකා ගොවිජන සේවා මධ්‍යස්ථානවල සේවයේ නියුතු නිලධාරීන් 16,880 ක් වෙත 2024 හා 2025 වර්ෂවලදී රු.760,575,459ක ණය ලබා දී ගොවිජන සේවා මධ්‍යස්ථාන 270ක ණය මුදල් ඉල්ලුම් කළ ගොවීන් 1,384ක් සඳහා රු.134,509,812ක මුදලක් තවදුරටත් ලබා දීමට තිබූ බව නිරීක්ෂණය විය.

3.2. තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුවත් අවස්ථා 100කදී අත්තිකාරම් පියවීම දින 11 සිට දින 149 දක්වා කාලයක් ප්‍රමාදව පැවති බව විගණයේ දී නිරීක්ෂණය විය.

3.3. බැංකු ගිණුම් මෙහෙයවීම

චෙක්පත් නිකුත් කළ දිනය, එය වලංගු කළ දිනය යන දෙකින් පසුව එළඹෙන දින සිට මාස 06කට වැඩි කාලයක් එය මුදල් නොකර තිබේ නම් හෝ ලිපි වලට පිළිතුරක් එවා නොමැති නම් ද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව ක්‍රියා කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල 2025 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව රු.1,378,499ක් වටිනා නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් 41ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) ගංවතුර හානි වලින් වූ සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ ලෙස හඳුනාගත් ව්‍යාපෘති 278 ක් සඳහා රු.මිලියන 630 ක් නිදහස් කර තිබුණ ද 2025 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික්ක 14 ක ගිවිසුම්ගත වූ ආකාරයට නිම නොකළ වැඩවල වටිනාකම රු.මිලියන 187.63ක් වූ ව්‍යාපෘති 49ක් විය.

(ආ) 2025 දෙසැම්බර් 31 දින වන විට අත්හැර දමන ලද වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 18 ක් සඳහා රු.මිලියන 202.6ක් නිදහස් කර තිබුණ ද ඉන් ව්‍යාපෘති 10කම වැඩ නියමිත පරිදි අවසන් කර නොතිබුණි. එසේම මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා බල ප්‍රදේශ 13ක පිහිටි ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති හා අත්හැර දමා ඇති වැව් 83 ක්, ක්‍රියාකාරී මට්ටමට පත් කිරීමට ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් ගොවි පවුල් 3,346 කට අයත් අස්වැද්දිය හැකි වගා භූමි අක්කර 4,101 ක් වගා කිරීමට නොහැකි වීමත්, එම දිස්ත්‍රික්කයේම ගොවිජන සේවා බල ප්‍රදේශ 04 ක පිහිටි අත්හැර දමා ඇති වැව් 21 ක් ප්‍රතිසංස්කරණය කිරීමෙන් ප්‍රතිලාභ ලබාදිය හැකි ගොවි පවුල් සංඛ්‍යාව හා අස්වැද්දිය හැකි වගා භූමි ප්‍රමාණය කොපමණද යන්න හඳුනාගෙන නොතිබුණි.

(ඇ) 2025 වර්ෂය තුළ වැව් අමුණු ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරකම යටතේ ව්‍යාපෘති 246ක් සඳහා රු.මිලියන 659.02ක් නිදහස් කර ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 243 න් දිස්ත්‍රික්ක 17ක ක්‍රියාත්මක කර තිබූ ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 201.2ක් වූ ව්‍යාපෘති 26 ක වැඩ අවසන් කර නොතිබුණි.

(ඈ) 2025 වර්ෂයේ කෘෂි මාර්ග අළුත්වැඩියාව යටතේ ව්‍යාපෘති 168ක් සඳහා රු.මිලියන 377 ක් නිදහස් කර දිස්ත්‍රික්ක 12ක ක්‍රියාත්මක කර ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 82.7ක් වූ ව්‍යාපෘති 23 ක කටයුතු 2025 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ඉ) ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශ 04 කට අයත් මාර්ග/ කෘෂි පාරවල් 05 ක් අලුත්වැඩියාව වෙනුවෙන් 2025 වර්ෂයේදී රු.මිලියන 7ක මුදලක් වැයකර තිබුණ ද ඊට අදාළ කුඹුරු යල හා මහ කන්න වශයෙන් නියමිත පරිදි වගා කිරීම හෝ එම අදාළ මාර්ග/ කෘෂි පාරවල් නිසි පරිදි නඩත්තු කර නොතිබීම මත තිරසාර දේශීය ආහාර

සුරක්ෂිතතාවය උදෙසා ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතියේ අරමුණු නියමිත පරිදි ඉටුවී නොතිබුණි.

(ඊ) ක්‍රියාකාරී සැලැස්ම අනුව මාළු හා ඉස්සන් ඇති කිරීමේ ව්‍යාපෘති සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රු.මිලියන 2ක ප්‍රතිපාදන වෙන්කර ව්‍යාපෘති 80 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර 2025 දෙසැම්බර් 31 දිනට එහි ප්‍රගතිය අනුව රු.මිලියන 6.2 ක ප්‍රතිපාදන නිදහස් කර ව්‍යාපෘති 60 ක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව වෙන්කල ප්‍රතිපාදන වටිනාකමට වඩා රු.මිලියන 4ක් වැයකර ව්‍යාපෘති 20 ක් අඩුවෙන් ක්‍රියාත්මක කර තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(උ) 2025 වර්ෂයේදී එක මිටට ගොවි බිමට වැඩ සටහන යටතේ රු.මිලියන 392.50 ක ප්‍රතිපාදන වෙන්කර ඉන් රු.මිලියන 257.04 ක ප්‍රතිපාදන නිදහස් කර මෙම වැඩසටහන යටතේ වැඩ ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 51 න් දිස්ත්‍රික්ක 04 ක ගිවිසුම්ගත වටිනාකම රු.මිලියන 81.32ක් වූ ව්‍යාපෘති 04 ක වැඩ අවසන් කර නොතිබුණි.

(ඌ) ගොවිජන කොමසාරිස් ජනරාල්ගේ 2025 අප්‍රේල් 09 දිනැති 02/2025 අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව වගා නොකරන සියලු කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂමව වගාකිරීම සඳහා වන ජාතික වැඩසටහනේ දී සම්පූර්ණ වගා කාලය වසර 3ට වැඩි භෝග වර්ග වගාකිරීම සඳහා දිස්ත්‍රික්ක 05 ක පමණක් අක්කර 61 රූඩ් 30 පර්චස් 0.95ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණ ද අදාළ වගා කටයුතු සම්බන්ධයෙන් අධික්ෂණය කර හෝ තොරතුරු පවත්වා ගැනීමක් සිදු කර නොතිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

4.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) ජලය, සනීපාරක්ෂාව සහ සෞඛ්‍ය ඉහළ නැංවීම පිළිබඳ (Wash) ව්‍යාපෘතිය යටතේ රු.1,571,021 ක් වැය කර කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාළ වන වැව් අමුණු අලුත්වැඩියා කිරීම, ගොඩනැගිලි සහ කෘෂිකාර්මික මාර්ග සංවර්ධනය වැනි ඉදිකිරීම් ආශ්‍රිත සංවර්ධන කාර්යයන් ඉටු කිරීමේදී එම කටයුතු මනා තත්ත්ව පාලනයකින් සිදු කිරීමට මෙන්ම එය තහවුරු කර ගැනීම අරමුණු කරගෙන මොනරාගල ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල භූමියේ ඉදිකිරීම් තත්ත්ව පරීක්ෂණාගාරය ඉදි කර තිබුණි. 2017 වර්ෂයේ දී මෙහි ඉදිකිරීම් අවසන් කර වර්ෂ 08 ක් පමණ ගත වී ඇතත් තත්ත්ව පරීක්ෂණ සිදුකළ බවට හෝ එම පරීක්ෂණාගාරය සඳහා ප්‍රධාන කාර්යාලයෙන් ලැබී තිබුණු උපකරණ 12 කට අදාළ ඒකක 34 ක් තත්ත්ව පරීක්ෂණාගාරය ක්‍රියාත්මක වීම පිළිබඳව වර්ෂ 08 ක් ගත වී ඇතත් එම කාර්යාලය හා උපකරණ නිෂ්කාර්යව පවතින බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) සුහුරු ආදර්ශ කෘෂි ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන කොමසාරිස්වරයා විසින් 2023 ඔක්තෝබර් 06 දින නිකුත් කර තිබූ අංක 7/3/19/S.A.V./2023 දරන මාර්ගෝපදේශයේ උපදෙස් අනුව හරිතාගාර ඉදිකිරීමෙන් පසු වගා කටයුතු වහා ආරම්භ කල යුතු වුවත් දිස්ත්‍රික්ක 06 ක ඉදි කර තිබුණු හරිතාගාර 48ක නිෂ්පාදන කටයුතු 2025 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඇ) සුහුරු කෘෂි ගම්මාන වැඩ සටහන - 2024 යටතේ මොනරාගල දිස්ත්‍රික්කයේ සුහුරු හරිතාගාර 15ක් ඉදි කිරීමට බාහිර ආයතනයක් සමග 2024 දෙසැම්බර් 23 දින රු.17,752,022 ක් වටිනා ගිවිසුමකට එළඹී 2025 ඔක්තෝබර් 31 වන විට බාහිර ආයතනය වෙත රු.6,501,231 ක් ගෙවා තිබුණි. දින 90 ක් තුළ ව්‍යාපෘතිය අවසන් කළ යුතු වුවත්, ගිවිසුම්ගත දිනය වන 2024 දෙසැම්බර් 23 සිට විගණිත දිනය වූ 2025 ඔක්තෝබර් 15 දක්වා දින 296 ක් ගත වී තිබුණ ද, හරිතාගාර 07 ක සියයට 25ක ප්‍රමාණයක් වැඩ අවසන් කර හෝ නොතිබුණි. ඒ අනුව අපේක්ෂිත කාලය තුළ ව්‍යාපෘතියේ අරමුණු ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි.

4.1.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

වී වගාව සඳහා පැරෂුට් ක්‍රමය භාවිතය තුලින් අස්වනු ඉහල නැංවීමේ ව්‍යාපෘතිය යටතේ 2025 වර්ෂයේ දී දිස්ත්‍රික්ක 05 ක කුඹුරු ඉඩම් අක්කර 5,804.78 ක වගා කිරීම සඳහා ගොවින්ට බෙදාදීම වෙනුවෙන් පැරෂුට් තවාන් තැටි 2,321,912 ක් මිලට ගැනීම සඳහා රු.මිලියන 163 ක ප්‍රතිපාදන වෙන්කර එම තැටි මිලට ගැනීම සඳහා අවස්ථා දෙකක දී ජාතික තරගකාරී ක්‍රමය යටතේ මිල කැඳවීම් කර තිබුණ ද දෙපාර්තමේන්තුව සුදුසු ලංසුකරුවකු තෝරා නොගැනීමෙන් මිළදී ගැනීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි. ඒ අනුව, මෙම කාර්ය ඉටුකිරීමට නොහැකි වී තිබුණි.

4.2. විදේශ ආධාර ව්‍යාපෘති

(අ) ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ 2022/23 මහ කන්නය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 50 ක මියුරේට් ඔෆ් පොටෑෂ් (MOP) රසායනික පොහොර ලැබී ගුන් ගොවීන්ට බෙදා නොහැර 2026 මාර්තු 31 වන විටත් ගොවිජන සේවා මධ්‍යස්ථාන ගබඩා තුල පොහොර කි.ග්‍රෑම් 1,670,914ක ප්‍රමාණයක් පැවති අතර මෙම පොහොර අලෙවියෙන් ලද මුදල් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ නිල බැංකු ගිණුමට බැර කර භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර එකතු වටිනාකම රු.98,771,987ක් වූ මුදල් මෙම වාර්තාවේ දින වන විටත් ගොවිජන සේවා මධ්‍යස්ථානවල ගිණුම් වල හා ස්ථාවර තැන්පතු ලෙස පවත්වා තිබුණි.

(ආ) ලෝක ආහාර වැඩසටහන යටතේ ලද මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) පොහොර 2024/25 මහ කන්නයේ දී වී වගා කරන ගොවීන් වෙත නොමිලේ බෙදා දීම සිදු කළ යුතු බවට උපදෙස් ලබා දීම සිදුකර තිබුණ අතර තවදුරටත් එම පොහොර තොග වලින් එසේ බෙදා දී ඉතිරි වී ඇති තොග

පවතී නම් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2025 නොවැම්බර් 18 දිනැති ලිපිය ප්‍රකාරව 2025/26 මහ කන්නයේ බීජ වී වගා කරනු ලබන ගොවීන් වෙත බීජ වී සඳහා පොහොර නිර්දේශයට අනුව මෙම පොහොර බෙදාහැරීමට උපදෙස් ලබා දී තිබිය දී 2026 පෙබරවාරි 24 දින වන විටත් කි.ග්‍රෑම් 2,070,340 ක පොහොර තොග ගොවීන් වෙත නිකුත් නොකර ඉතිරිව පවතින අතර දිස්ත්‍රික් කාර්යාල 07කට අදාළව කි.ග්‍රෑම් 10,720 ක පොහොර තොග ප්‍රමාණයක් අස්ථාන ගත වී ඇති බවත් විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) ලෝක බැංකු ආධාර යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන්ගේ, ක්ෂේත්‍ර බෝග වගාකරුවන්ගේ බෝග ගබඩා කිරීම සඳහා 2021 වර්ෂය තුලදී රු.88,715,390 ක් වැය කර දිස්ත්‍රික්ක 06ක මෙ.ටොන් 900 ක ධාරිතාවයෙන් යුත් ගබඩා 11 ක් ඉදිකිරීම නිමකර ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත පවරා දී පැවති අතර අනුරාධපුර මැදවච්චිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගබඩාවක් ඉදිකිරීම සඳහා රු.2,462,454 ක් වැය කර තිබුණ ද එම කාර්යය නිම නොකිරීමත් සියලුම ගබඩා කිසිදු ප්‍රයෝජනයකට නොගැනීම හේතුවෙන් දරන ලද වියදම නිශ්කාර්ය වී තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

4.3 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 02 ක නිලධාරීන් දෙදෙනෙකු විසින් රු.7,288,244 ක් වටිනා අයථා පොහොර තොග පරිහරණය සම්බන්ධයෙන් විනය නියෝග නිකුත් කර තිබුණද, එම මුදල් අයකරගෙන විනය නියෝග ක්‍රියාත්මක කර නොතිබූ අතර, ගොවිජන සේවා කාරක සභා 02 ක නිලධාරීන් තිදෙනෙකු වෙත රු.10,295,843 ක් වටිනා අයථා පොහොර තොග සම්බන්ධයෙන් චෝදනා පත්‍ර නිකුත් කර තිබුණ ද, විධිමත් විනය පරීක්ෂණ පවත්වා එම මුදල් අයකරගෙන නොතිබුණි.

4.4 කළමනාකරණ දුර්වලතා

(අ) මූලික විමර්ශන 467ක්, මූ.රෙ.104 පරීක්ෂණ 114ක්, විධිමත් පරීක්ෂණ 85ක් හා වෙනත් පරීක්ෂණ 146ක් වශයෙන් විනය ලිපිගොනු 812ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගොවිජන බැංකුවට අනුයුක්තව සේවය කරන ලද කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර නිලධාරිනියකගෙන් 1998 සිට 2022 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ සිදු කර ඇති රු.1,353,471 ක මූල්‍ය අක්‍රමිකතා වලට අදාළව රු.516,606 ක මුදලක් විගණිත දිනය වූ 2025 ඔක්තෝබර් 08 දින වන විට තවදුරටත් අයවිය යුතු වූ අතර මෙම සමස්ත මූල්‍ය අක්‍රමිකතාවය පිළිබඳව විධිමත් විනය පරීක්ෂණයක් මාතලේ ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් සිදු කර නොතිබුණි.

(ඇ) විනය පරීක්ෂණ සම්බන්ධ විමර්ෂණ කටයුතු අවසන් කරන ලද විමර්ෂණ වාර්තා 53කින් නිලධාරීන්ගෙන් අයකර ගැනීමට නියෝග කරන ලද රු.33,292,915ක මුදලක් අයකර ගත යුතුව පැවතුණි.

(ඈ) සිය පවුල් ඒකකය, ආර්ථිකමය, සාමාජීය, සංස්කෘතිමය, සෞඛ්‍ය හා පෝෂණය යනාදී සෑම අංශයන්ට සංතෘප්ත කිරීම උදෙසා කාන්තාවන් සවිබලකරණය කිරීමේ අරමුණින් සිතමු කාන්තා ගොවි සංවිධාන 1,108ක් මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා බල ප්‍රදේශ 23 ක පිහිටුවා තිබුණද ඉන් සාමාජික සංඛ්‍යාව 12,026 ක් සිටින ගොවි සංවිධාන 583 ක් අක්‍රිය තත්ත්වයේ පැවතුණි.

5 යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම/ මහජන පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම

රාජ්‍ය පරිපාලන පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අංක 18/89 හා 1989 මාර්තු මස 23 දිනැති මහජන පැමිණිලි විෂයට අදාලව නිකුත් කල චක්‍රලේඛය ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් කාර්යාලය වෙත 2025 දෙසැම්බර් 08 දිනට ලැබී තිබූ මහජන පැමිණිලිවලින් පිළිතුරු ලබා නොදුන් මහජන පැමිණිලි 81ක් තවදුරටත් පැවති බව විගණනයේ දී නිරීක්ෂණය විය.

6 මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 19,764 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 12,798 ක් වුයෙන් එම 6,966 ක පුරප්පාඩු නැවත සමාලෝචනය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

පී.කේ.එම්.පී.නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පී.කේ.එම්.පී. නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය